# වෙළෙඳ පොළ ක්‍රියාවලියට රජයේ මැදිහත්වීම.

වෙළෙඳපොළ බලවේග මගින් තීරණය වී ඇති නිදහස් සමතුලිතය, සමාජයට අහිතකර යැයි දේශපාලන වශයෙන් හා සමාජයීය දෘෂ්ඨිකෝණයෙන් සිතුන විට මිල පාලන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරනු ලබයි. ඔනම, වෙළෙඳ පොළ යාන්ත්‍රණයේ ක්‍රියාකාරිත්වය අක්‍රිය කොට අවම මිල සහ උපරිම මිල මගින් නීතිමය වශයෙන් රජයෙන් වෙළෙඳ පොළට මැදිහත් වේ.ඊට අමතරව බදු හා සහනාධාර ලබාදීම මගින් ද සළාකණය තුළින් ද වෙළෙඳ පොළ සමතුලිතයට රජය බලපෑම් කරයි. මෙසේ රජය මැදිහත්වීම නිසා වෙළෙඳ පොළ කාර්යක්ෂමතාවයටය හා සමාජ ශුභ සාධනයට බලපෑම් ඇති කරයි.

1. රජය බදු පැනවීම 2. සහනාධාර දීම 3. උපරිම මිලක් පැනවීම 4. අවම මිලක් පැනවීම හෝ එය සහතික මිලක් ලෙස නම් කිරීම් 5. සළාකණය

➔ රජය බදු පැනවීම :*

රජය විසින් භාණ්ඩ හා සේවා මත අය කරනු ලබන බදු නිෂ්පාදකයා මත මෙන්ම පාරිභෝගිකයා මත ද අය කරනු ලබයි. දෙදෙනාගෙන් කවුරුන් මත අය කළද ප්‍රතිඵල සමාන වේ.


- භාණ්ඩ ඒකක මත අය කරනු ලබන බදු (විශේෂිත අය බද්ද)
- භාණ්ඩ වල වටිනාකම මත අයකරනු ලබන බදු (ප්‍රතිශතක බද්ද)

නිෂ්පාදකයා මත නිශ්චිත රුපියල් ප්‍රමාණයක් භාණ්ඩ ඒකක සංඛ්‍යාව මත අය කරනු ලබන්නේ ඒකක බද්ධකදීය. නමුත් භාණ්ඩ හා සේවා වල වටිනාකම පදනම් කරගෙන බදු අය කරන්නේ නම්, එය වටිනාකම මත බද්දකි. වැට් බදු ආදිය භාණ්ඩ වල වටිනාකම මත අයකරනු ලබන බදු වේ. නමුත් අපගේ දැඩි අවධානය යොමු වන්නේ රජය අයකරනු ලබන **ඒකක බදු** කෙරෙහිය.


අලෙවි කරන්නන් මත පනවනු ලබන බදු නිසා නිෂ්පාදන පිරිවැය අනිවාර්යයෙන් ම ඉහළ යන අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් සැපයුම අඩුවිය හැකිය. මේ නිසා සාමාන්‍යයෙන් සිදු වන්නේ සැපයුම් වක්‍රය වමට විතැන් වීමයි. නමුත් බදු නිසා භාණ්ඩයේ මිල ඉහළ යන ප්‍රමාණය තීරණය වන්නේ ඉල්ලුම් හා සැපයුම් නම්‍යතාවය මතය. බදු ආපාතය ගැණුම්කරුවන් හා විකුණුම්කරුවන් අතර බෙදී යන ආකාරය අදාළ භාණ්ඩයේ ඉල්ලුම් සැපයුම් නම්‍යතාවය මත රඳා පවතී.

බදු අය කිරීම නිසා වෙළෙඳපොළට වන බලපෑම සංඛ්‍යා සටහනකින්, ප්‍රස්තාරයෙන් හා සමීකරණයෙන් පෙන්වීමට පුලුවන.

බදු වල ආර්ථික ප්‍රතිවිපාක :



| | පෙර | පසු |
|---|---|---|
| පාරිභෝගික අතිරික්තය | a , b, c, d | a |
| නිෂ්පාදක අතිරික්තය | e, f, g | g |
| රජයේ ආදායම | | b,c ,e |
| අහිමි වන ශුභ සාධනය | | d, f |
| පාරිභෝගිකයා දරන බදු බර | | b , c , |
| නිෂ්පාදකයා දරන බදු බර | | e |




රජයේ ආදායම = බද්ද x අලෙව් ප්‍රමාණය

අහිම වි යන සමාජ ශුභ සාධනය = බද්ද x සමතුලිත ප්‍රමාණයේ වෙනස / 2

බද්ධක් පැනවීම නිසා වෙළෙඳ පොළේ අහිමිවන සමාජ ශුභසාධනයක් ඇතිවීම (අධි බදු බර) වැළැක්විය නොහැකිය. නමුත් එවැනි අධි බදු බරක්ඇති නොවන අවස්ථා දෙකක් හඳුනාගත හැකිය. විශේෂයෙන්ම පූර්ණ අනම්‍ය සැපයුමක් පවතින අවස්ථාවේ දීය. ඊට අමතරව පූර්ණ අනම්‍ය ඉල්ලුමක් පවතින විට ද අහිමි වන සමාජ ශුභ සාධනයක් ඇති නොවේ.

එසේම ඉල්ලුම් හා සැපයුම් නම්‍යතාවයන් සමාන අගයක් ගන්නා විට බදු බර සමානව බෙදී යාමක් දැකීමට පුලුවන.

නිෂ්පාදන බද්දක් පැනවීම නිසා ඌණ නිෂ්පාදනයක් හට ගනී. නිෂ්පාදනය අඩුවන විට MB>MC වන අතර එය ශුභ සාධනයට අහිතකර වේ. එමගින් පාරිභෝගික අතිරික්තයට හා නිෂ්පාදන අතිරික්තයට හානිකර බලපෑමක් ඇති කෙරේ. භාණ්ඩ මත පනවනු ලබන බදු ආන්තික ප්‍රතිලාභ හා ආන්තික පිරිවැය අතර පරතරයක් ඇති කරන බැවින්, එය ආර්ථිකයේ සම්පත් බෙදීයාමෙ කාර්යක්ෂමතාවයට හානිකර වේ. එමගින් පාරිභෝගික අතිරික්තයට හා නිෂ්පාදන අතිරික්තයට හානිකර බලපෑමක් ඇති වේ.

බදු බර බෙදී යන ආකාරය ඉල්ලුම් සැපයුම් නම්‍යතාවය මත තීරණය වේ. පහත සඳහන් වෙළෙඳ පොළ තත්ත්වයන් යටතේ ආර්ථික බලපෑම් ගණනය කරන්න.

1. Qd = 160 - 5p        Qs = - 120 + 15p        බද්ද - රු.4/=
2. Qd = 140 - 10P        Qs = 10p        3. Qd = 180 - 20p        Qs = 80
4. Qd = 60 - 5p        P = 5
5. Qd = 600        Qs = - 50 + 25        6. P = 12        Qs = - 40 + 8p

ඉහත සෑම තත්ත්වයකදීම රජය සෑම ඒකකයක් මතම රු.4/= ක බද්ධක් අයකිරීමට තීරණය කරන්නේ නම් ප්‍රස්ථාර ඇඳ පහත තත්ත්වයන් ගණනය කරන්න.

1 පරිභෝගික හා නිෂ්පාදන අතිරික්තයට වන බලපෑම.
2 සමතුලිත අවස්ථාවේ දී ඉල්ලුම් හා සැපයුම් නම්‍යතාවයන් ගණනය කරන්න.
3 රජයේ ආදායම, අහිමි වී යන සමාජ ශුභ සාධනය ගණනය කරන්න.
4 බදු බර බෙදී යන ආකාරය රූප සටහනින් සහ ගණනය කිරීමෙන් පෙන්වන්න.

බදු බර බෙදී යන ආකාරය පිළිබඳ ඔබේ මත ඉදිරිපත් කරන්න.

ඉල්ලුම් සැපයුම් නම්‍යතාවයන් අනුව බදු බර බෙදී යන ආකාරය පහත සමීකරණයෙන් සෙවීමට පුලුවන.

$$\textbf{පාරිභෝගිකයා දරණ බදු බර} = \frac{\textbf{සැපයුම් නම්‍යතාවය}}{\textbf{සැපයුම් නම්‍යතාවය - ඉල්ලුම් නම්‍යතාවය}} \times \textbf{බද්ද}$$

ඉල්ලුම් සැපයුම් නම්‍යතාවයන් අනුව බදු බර බෙදී යන ආකාරයන් පිළිබඳ විමසීමක් කරන්න.

➔ රජය සහනාධාර දීම.

සමහර භාණ්ඩ පරිභෝජනය, සමහර භාණ්ඩ නිෂ්පාදනය, දිරිමත් කිරීම සඳහා රජය විසින් පාරිභෝගිකයා මත හෝ නිෂ්පාදකයා වෙත සහනාධාර සපයනු ලබයි. එහෙත් මෙහි දී අපගේ අවධානය යොමු වන්නේ නිෂ්පාදකයා මත ලබා දෙන සහනාධාර සම්බන්ධයෙනි. එසේම නිෂ්පාදකයා මත ලබා දෙන සහනාධාරය ද ආකාර දෙකකි.

1. වටිනාකම මත සහනාධාර        2. ඒකක සහනාධාරය

මෙහිදී ද අපගේ වැඩි අවධානය යොමු වන්නේ ඒකක සහනාධරය කෙරෙහිය.


නිෂ්පාදනය කරනු ලබන සෑම භාණ්ඩ ඒකකයක් මතම නිශ්චිත සහනාධාර මුදලක් ලබා දෙන විට සාමාන්‍යයෙන් සිදු වන්නේ සැපයුම් වක්‍රය දකුණට විතැන් වීමයි. සහනාධාරය නිසා නිෂ්පාදන පිරිවැය අඩුවන බැවින් සෑම මිලකදීම නිෂ්පාදකයන් සැපයීමට කැමති ප්‍රමාණය සහනාධාර නොමැතිව සැපයීමට කැමති වූ ප්‍රමාණයට වඩා වැඩි වනු ඇත. නමුත් සහනාධාර නිසා භාණ්ඩයේ මිල පහළ යන ප්‍රමාණය තීරණය වන්නේ ඉල්ලුම් හා සැපයුම් නම්‍යතාවය මතය.

සහනාධාරයේ ප්‍රතිඵල වශයෙන් පාරිභෝගිකයන්ට භාණ්ඩය පෙරට වඩා අඩු මිලකට මිල දී ගැනීමට

අවස්ථාව සැළසෙන අතර විකුණුම්කරුවන්ටද පෙරට වඩා වැඩි මිලක් උපයා ගැනීමට හැකි වේ.


විකුණුම් කරුවන්ට ලැබෙන මිල හා ගැණුම් කරුවන් ගෙවන මිල අතර වෙනස ඒකක සහනාධාරයේ ප්‍රමානයට සමාන වේ. නිෂ්පාදකයන්ට භාණ්ඩය සඳහා ලැබෙන මිල ගැණුම් කරුවන් භාණ්ඩය සඳහා ගෙවනු ලබන මිලට වඩා ඉහළ අගයක් ගනු ඇත.


සහනාධාර දීම නිසා වෙළෙඳ පොළට වන බලපෑම සංඛ්‍යා සටහනකින්, ප්‍රස්ථාරයෙන් හා සමීකරණයෙන් පෙන්වීමට පුලුවන.





| | පෙර | පසු |
|---|---|---|
| පාරිභෝගික අතිරික්තය | a , b, | a, b,d,f,g |
| නිෂ්පාදක අතිරික්තය | d | d,b,c |
| රජයේ වියදම | | b,c ,d,e,f,g |
| **අහිමි වන ශුභ සාධනය** | | **e** |
| පාරිභෝගිකයාට ලැබෙන සහනාධාරයේ වාසිය | | d,f,g |
| නිෂ්පාදකයා ට ලැබෙන සහනාධාරයේ වාසිය | | b , c , |


**පෙර පාරිභෝගික අතිරික්තය හා පසු පාරිභෝගික අතිරික්තය**







**පෙර නිෂ්පාදක අතිරික්තය හා පසු නිෂ්පාදක අතිරික්තය**





**රජයේ ආදායම**




අහිමි වන සුභ සාධනය





නිෂ්පාදන සහනාධාරයක් පැනවීම නිසා අධි නිෂ්පාදනයක් හට ගනී. නිෂ්පාදනය වැඩිවන විට MB<MC වන අතර එය ශුභ සාධනයට අහිතකර වේ.

**නිෂ්පාදන සහනාධාර, වෙළෙඳ පොල සමතුලිතය හා ශුභ සාධනය කෙරෙහි බලපාන ආකාරය**

- නිෂ්පාදනය කරනු ලබන සෑම භාණ්ඩ ඒකකයක් සඳහාම නිශ්චිත සහනාධාර මුදලක් ලබා දෙන විට වෙළෙඳ පොල සැපයුම් වක්‍රය දකුණට විතැන් වේ.
- සහනාධාරය නිසා නිෂ්පාදන පිරිවැය අඩුවන නිසා සෑම මිලකදීම නිෂ්පාදකයන් සැපයීමට කැමති ප්‍රමාණය සහනාධාරයක් නොමැතිව සැපයීමට කැමති වූ ප්‍රමාණයට වඩා වැඩිවනු ඇත.
- නිෂ්පාදකයන්ට භාණ්ඩය සඳහා ලැබෙන මිලත් ගැණුම් කරුවන්ට භාණ්ඩය සඳහා ලැබෙන මිලත් එකිනෙකට වෙනස්ය.
- නිෂ්පාදකයන්ට භාණ්ඩය සඳහා ලැබෙන මිල ගැණුම් කරුවන් භාණ්ඩය සඳහා ගෙවනු ලබන මිලට වඩා ඉහළ අගයක් ගනු ඇත.
- නිෂ්පාදකයන්ට ලැබෙන මිල හා ගැණුම් කරුවන් භාණ්ඩය සඳහා ගෙවනු ලබන මිල අතර වෙනස, හරියටම සහනාධාරයේ ප්‍රමාණයට සමාන වේ.
- සහනාධාරයේ ප්‍රතිඵල වශයෙන් පාරිභෝගිකයන්ට, භාණ්ඩය පෙරට වඩා අඩු මිලකට මිල දී ගැනීමට අවස්ථාව සැලසෙන අතර විකුණුම්කරුවන්ටද පෙරට වඩා වැඩි මිලක් උපයා ගැනීමට හැකි වේ.
- පාරිභෝගිකයන් හා විකුණුම් කරුවන් අතරින් සාපේක්ෂව වඩා අනම්‍ය වන තැනැත්තා සහනාධාරයේ වැඩි වාසිය හිමි කර ගනී.
- වඩා නම්‍ය පුද්ගලයාට හිමිවන්නේ අඩු වාසියකි.

## ➔ උපරිම මිල නියම කිරීම

කිසියම් භාණ්ඩයක් වෙළෙඳ පොලේ විකිණිය හැකි උපරිම මිල නීතියෙන් නියම කිරීමයි. ඊට වඩා වැඩි මිලකට විකිණීම නැතිනම් අලෙවි කිරීම නීති විරෝධී වේ. මෙමගින් පාරිභෝගිකයන්ට සහනයක් ලබාදීම අපේක්ෂා කරයි. අත්‍යවශ්‍ය භාණ්ඩ මිලට මෙන්ම, ගෙවල් කුලී පොලී අනුපාත ආදියටද උපරිම මිල නියම කරන අවස්ථා ඇත. උපරිම මිල සමතුලිත මිල හා සම්බන්ධ වීමක් නැත.




රජය විසින් පනවන ලද උපරිම මිල සාර්ථක කර ගැනීම සඳහා පවතින භාණ්ඩ ප්‍රමාණය සළාක කර දෙන්නේ නම් පහත පරිදි ආර්ථික ප්‍රතිවිපාක දැක්විය හැක.


| | පෙර | පසු |
|---|---|---|
| පාරිභෝගික අතිරික්තය | a , b, c | a, b,d, |
| නිෂ්පාදක අතිරික්තය | d ,e,f | f |
| ආර්ථික අතිරික්තය | a, b, c, d, e,f | a, b,d,f |
| **අහිමි වන ශුභ සාධනය** | | c, e |

හිගය ආනයනය කර දෙන්නේ නම්, නිෂ්පාදන අතිරික්තය අඩු වුව ද පාරිභෝගික අතිරික්තය වැඩිවේ.

එසේ නොමැතිව b හා d කොටස් පාරිභෝගික අතිරික්තයට ඇතුළත් වන්නේ ද යන්න තීරණය වන්නේ, භාණ්ඩ ලබා ගැනීමට කෙතරම් පිරිවැයක් දැරුවේ ද යන්න මතය.

උදා:* පෝලිම්වල සිටීමට ගතවන කාලය

(හිගය ආනයනය කර දෙන්නේ නම්, පාරිභෝගික අතිරික්තය a,b,c,d,e,f,g,h දක්වා වැඩිවෙන අතර අහිමි වන සමාජ ශුභ සාධනයක් ඇති නොවේ. නමුත් රජයට Q1 සිට Q2 දක්වා භාණ්ඩ ප්‍රමාණය ආනයනය කිරීමට පිරිවැයක් ඇති වේ.)




උපරිම මිල හෙවත් මිල පාලනය අර්ථවත් එකක් වීමට නම්, පාලන මිල සමතුලිත මිල සමග සම්බන්ධ විය යුතුය.

උපරිම මිල නිසා,

- අධි ඉල්ලුමක් බිහිවේ.
- නිෂ්පාදන අතිරික්තය අඩු වේ.
- පාරිභෝගික අතිරික්තය වැඩි වේදැයි නිශ්චිතව කිව නොහැක.
- භාණ්ඩ ලබා ගැනීමට පෝලිම් වල සිටීමට හෝ භාණ්ඩ සොයමින් ඇවිදීමට සිදු විය හැකිය.
- කලුකඩ මිලක් බිහි වීමට ද පුලුවන.

උපරිම මිලක් පැනවීම නිසා වෙළෙඳ පොළ මිල යන්ත්‍රණයෙන් සිදු නොවේ. ඒ සඳහා විකල්ප විධිමත් හෝ අවිධිමත් යාන්ත්‍රනයක් බිහි වේ.

- ★ පෝලිම් ක්‍රමය
- ★ සළාක කූපන්පත් ක්‍රමය
- ★ අල්ලස් මගින් සළාක කිරීම
- ★ වෙනත් භාණ්ඩ සමග සම්බන්ධ කොට බෙදා හැරීම

ආදී ක්‍රම මගින් භාණ්ඩ බෙදා හැරිය හැකිය. නමුත් පාරිභෝගිකයන්ට අවශ්‍ය තරම් භාණ්ඩ නොලැබෙන විට කලු කඩ මිලක් ඇති වීමට පුලුවන. එනම්, ප්‍රකාශිත මිලට පටහැනි හා ඊට වඩා වැඩි මිලකට අලෙවි කිරීමයි සිල්ලර වෙළඳ සංඛ්‍යාව වැඩි වන විට බලධාරීන්ට පාලනය කිරීමට අපහසු වේ. නමුත් සමස්ත සැපයුමම කලුකඩ මිලට නොවිකිණේ.


උපරිම මිල නිසා වෙළෙඳ පොළ කාර්යක්ෂමතාවයට බාධා ඇති වේ.

උපරිම මිල අර්ථවත් කර ගැනීම සඳහා ගත හැකි ක්‍රියා මාර්ග:-

-ආනයනය
-සළාකකිරීම
-නිෂ්පාදකයන් දිරි ගැන්වීම

## ➔ අවම මිල

කිසියම් භාණ්ඩයක් හෝ සේවාවක් සඳහා රජය විසින් නියම කරන අඩුම මිල වේ. ඊට වඩා අඩු මිලක් ගෙවීම නීති විරෝධී වේ. (නමුත් නිෂ්පාදකයන් එකතු වීමෙන් ද මෙවැනි අවම මිලවල් පනවා ගන්නා අවස්ථා පවතී)පහත දැක්වෙන්නේ අවම මිල යටතේ වුව, පාරිභෝගිකයන් ඉල්ලනු ලබන ප්‍රමාණය පමණක් නිෂ්පාදනය කරනු ලබන විට වෙළෙඳ පොලේ ඇතිවන තත්වයයි.





වෙළඳපොලේ තීරණය වී ඇති මිල නිෂ්පාදකයාට අවාසිදායක වූ විට, රජය විසින් අවම මිලක් පනවනු ලැබේ. අවම මිල නිසා වෙළඳපොලේ අධි සැපයුමක් ඇති වේ. ශ්‍රම වෙළඳපොලේ දී නම්, සේවා වියුක්තියක් ඇති වේ.

අවම මිලක් පැනවීම නිසා ආර්ථිකයේ පැවති අකාර්යක්ෂමතා පහත පරිදි වේ.

1. පාරිභෝගික අතිරික්තය අඩු වේ.
2. නිෂ්පාදන අතිරික්තය වැඩි වේ.
3. අහිමි වන ශුභ සාධනයක් ඇති වීම.
4. ගැණුම් කරුවන් නොමැතිව අතිරික්ත නිෂ්පාදන ගොඩ ගැසීම.(අකාර්යක්ෂම සම්පත් භාවිතයකි)
5. සේවා අතිරික්ත වූ විට එය ඉවත් කිරීම ගැටලු සහගත වීම.(සේවා වියුක්තියක් ඇති වීම)
6. නීතියෙන් පලායාම සඳහා අවම මිල හුදෙක් නාමික මිලක් ලෙස සළකා වෙළෙඳුන් වට්ටම් ක්‍රම යටතේ තම නිෂ්පාදන අලෙවි කිරීම. (උදා - ගුවන් ටිකට්)
7. අවම මිල ඉහළ මිලක් නිසා ආයෝජකයන් මෙම භාණ්ඩ නිෂ්පාදනයට වැඩි සම්පත් ප්‍රමාණයක් යොමු කිරීම තුලින් අධි ආයෝජනයක් ඇති වීම.

අධි නිෂ්පාදන වෙළඳ පොලේ පවතින්නේ නම්, ඒවායින් අතුරු නිෂ්පාදන බිහි කිරීම, වෙනත් භාණ්ඩයක් සමඟ සම්බන්ධ කොට විකිණීම, අපනයනය කිරීම ආදිය සිදු කළ හැකිය. එසේ අධි නිෂ්පාදන ඉවත් කිරීමේ ක්‍රම වේදයක් නොමැතිව අවම මිල යටතේ නිෂ්පාදනය කළ හැකි උපරිම නිෂ්පාදන ප්‍රමාණය නිෂ්පාදනය නොකර පාරිභෝගිකයන් විසින් ඉල්ලන ප්‍රමාණය පමණක් නිෂ්පාදනය කරන්නේ නම්, කරන්නේ නම්, වෙළෙඳ පොලේ තත්ත්වය පහත පරිදි දැක්විය හැක.




| | පෙර | පසු |
|---|---|---|
| පාරිභෝගික අතිරික්තය | a , b, c | a, |
| නිෂ්පාදක අතිරික්තය | f, g, h | b,f,h |
| ආර්ථික අතිරික්තය | a, b, c,f,g,h | a, b,f ,h |
| **අහිමි වන ශුභ සාධනය** | | c, g |

## අවම මිල යටතේ නිෂ්පාදකයා දිරිමත් වී උපරිම නිෂ්පාදනය කරන්නේ නම්, ශුභ සාධන ප්‍රතිවිපාකය :

නමුත් එම මිල යටතේ නිපද විය හැකි උපරිම ප්‍රමාණය නිෂ්පාදනය කළ පසු එම මුලු නිෂ්පාදන ප්‍රමාණය මිලට ගෙන අපනයනය කරන්නේ නම් හෝ අතුරු නිෂ්පාදන බිහි කරන්නේ නම්, නිෂ්පාදන අතිරික්තය b,c,d,f,g,h දක්වා වැඩි වේ.

එසේ නිෂ්පාදකයන් විසින් අවම මිල යටතේ දිරිමත් වීමෙන් උපරිම ප්‍රමානය නිෂ්පාදනය කර අලෙවි කර ගැනීමට නොහැකි වන්නේ නම්, නිෂ්පාදකයාට ලාබ ද පාඩු ද යන්න නිශ්චිතව කිව හැක්කේ, නිෂ්පාදකයාගේ මුලු අයභාරයෙන් (මිල ෦ අලෙවි ප්‍රමාණය - මුලු විචල්‍ය පිරිවැය) මුලු විචල්‍ය පිරිවැය (මුලු නිමැවුම් පිරිවැය) අඩු කිරීමෙන් පසුවයි.
ඒ අනුව ඉහත ප්‍රස්ථාර සටහනේ පරිදි නිෂ්පාදකයාගේ අතිරික්තය = (b,f,h,i)-(l,j,k,e) වේ.

අවම මිල අර්ථවත් කිරීම සඳහා ක්‍රියා මාර්ග ගත හැකියඑනම් .

- අතිරික්තය ගබඩා කිරීම.
- අතුරු නිෂ්පාදන බිහි කිරීම.
- පවත්නා ඉල්ලුම ප්‍රවර්ධනය.
- අපනයනය

**සහතික මිල (මිල ආධාරක ප්‍රතිපත්තිය)**


අවම මිල සමග මිල ආධාරක ප්‍රතිපත්තියක් හඳුන්වා දීම මින් අදහස් වේ. ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තයට මෙය බොහෝවිටම ලබා දෙයි. අවම මිල පැනවීමෙන් පසු ඇතිවන අතිරික්ත සැපයුම නැති කිරීමට රජය විසින් සහතික වීමක් මෙමගින් සිදු කෙරේ. එමගින් නිෂ්පාදකයාට ඉහළ මිලක් ලබා දී නිෂ්පාදකයා නිෂ්පාදකයා දිරිමත් කිරීමක් සිදු වේ.

මෙසේ ආණ්ඩුවේ සහතික මිල ප්‍රතිපත්තිය හෙවත් අවම මිල යටතේ මිල ආධාරක ප්‍රතිපත්තිය ලබා දෙන ආකාර දෙකකි.

- ★ රජය මිල දී ගැනීමේ මිල ආධාරක ප්‍රතිපත්තිය
- ★ ණය පූරණය කිරීමේ මිල ආධාරක ප්‍රතිපත්තිය

**රජය මිල දී ගැනීමේ මිල ආධාරක ප්‍රතිපත්තිය**

අවම මිල යටතේ පවතින අධි සැපයුම රජය විසින් මිල දී ගෙන අධි සැපයුම නැති කිරීමක් මේ යටතේ සිදු වේ මෙසේ ආණ්ඩුව සහතික මිල ප්‍රතිපත්තිය අනුව අතිරික්ත සැපයුම මිල දී ගත් විට ඇතිවන ආර්ථික ප්‍රති විපාක පහත පරිදි වේ.





| | පෙර | පසු |
|---|---|---|
| පාරිභෝගික අතිරික්තය | a , b, c | a, |
| නිෂ්පාදක අතිරික්තය | d,e | b,c,e,d,j |
| රජයේ වියදම | | c,e,g,h,k,j |
| අහිමි වන සමස්ථ සමාජ ශුභ සාධනය (අඩුවන ආර්ථික අතිරික්තය) | | c,e.g,h,k, |
| අහිමි ශුභ සාධනය | | k |

මේ අනුව,


- පාරිභෝගික අතිරික්තය අඩු වේ
- නිෂ්පාදක අතිරික්තය වැඩිවේ
- සමාජ ශුභ සාධනයේ අහිමි වීම ඉහළ යාම්
- රජයට පිරිවැයක් දැරීමට සිදු වීම්

නිෂ්පාදන අතිරික්තය වැඩිවීම අනිවාර්යයෙන් සිදු වේ. නමුත්, රජයේ වියදම වැඩිවීම සිදු කරනුයේ රජයේ බදු ආදායම මගිනි. ඒ අනුව අවසාන වශයෙන් දරන්නේ පාරිභෝගිකයාය.


රජය මිල දී ගැනීමට පෙර නිෂ්පාදන අතිරික්තය





රජය මිල දී ගැනීමට පසු නිෂ්පාදන අතිරික්තය






රජය මිල දී ගැනීමට පෙර පාරිභෝගික අතිරික්තය




රජය මිල දී ගැනීමට පසු පාරිභෝගික අතිරික්තය








## ඌණ පූරණය කිරීමේ මිල ආධාරක ප්‍රතිපත්තිය

වෙළෙඳ පොලේ මිලදී ගැනීම්වලට මැදිහත් නොවී වෙළෙඳ **පොල** මිලට වඩා ඉහළ **මිලක්** නිෂ්පාදකයාට ලබා දීමට කටයුතු කරයි. ඒ අනුව සහතික මිල හා වෙළෙඳ **පොලේ විකුණන මිල අතර වෙනස රජය විසින් නිෂ්පාදකයාට ලබා දෙයි.** ඒ අනුව සහතික මිල හා වෙළඳ **පොලේ පාරිභෝගිකයින් විසින් ගෙවීමට කැමති මිල අතර වෙනස, නිෂ්පාදකයාට රජය විසින් ලබා දීමේ මිල ආධාරක ප්‍රතිපත්තිය ඌණපූරණ ගෙවීමේ ක්‍රමයයි.**






P3 නැමති සහතික මිල යටතේ නිෂ්පාදකයෝ, ඉහළ මිලක් නිසා දිරිමත් වී වැඩි නිෂ්පාදනයක්, Q3 සිදු කරයි. මේ නිසා වෙළඳ පොලේ අතිරික්ත නිෂ්පාදනයක් බිහි වේ. රජය විසින් මෙම අතිරික්ත නිෂ්පාදනය නැති කිරීමට පාරිභෝගිකයන් එම නිෂ්පාදන ප්‍රමාණය මිල දී ගැනීමට කැමති මිලකට දෙන ලෙසත් එසේ පාරිභෝගිකයා ගෙවන මිල සහතික මිල අතර වෙනස රජය විසින් පාරිභෝගිකයාට ලබා දෙන බවටත් සහතික වේ. ඒ අනුව Q3 නිෂ්පාදන ප්‍රමාණය පාරිභෝගිකයන් ඉල්ලනු ලබන්නේ, P3 මිලටය මේ අනුව P-P3 මිල අතර වෙනස නිෂ්පාදකයාට ලබා දීමට රජයට සිදු වේ. එය රජයේ ඌණ පූරණ වියදමයි ඌණ පූරණය නිසා නිෂ්පාදන අතිරික්තය මෙන්ම පාරිභෝගික අතිරික්තය ද වැඩි වේ.

| | පෙර | පසු |
|---|---|---|
| පාරිභෝගික අතිරික්තය | a , b, c | a,b,c,f,g |
| නිෂ්පාදක අතිරික්තය | c,d | c,d,b,j |
| රජය මිල දී ගැනීමේ වියදම | | b, c,f,g,i,j |
| අහිමි වන ශුභ සාධනය | | i |


රජයේ ඌණ පූරනයට පෙර නිෂ්පාදක අතිරික්තය





රජය ඌණ පූරණයට පසු නිෂ්පාදක අතිරික්තය





රජයේ ඌණ පූරණයට පෙර පාරිභෝගික අතිරික්තය




රජය ඌණ පූරණයට පසු පාරිභෝගික අතිරික්තය








සහතික මිල යටතේ නිෂ්පාදනය වැඩි වුව ද එය අකාර්යක්ෂම සම්පත් භාවිතයකි. මෙම නිමැවුම් පරාසයේ දී ආන්තික ප්‍රතිලාභ ආන්තික පිරිවැයට සමාන නොවේ.

මේ අනුව,
- පාරිභෝගික අතිරික්තය ද වැඩිවේ..
- නිෂ්පාදක අතිරික්තය වැැඩිවේ.
- සමාජ ශුභ සාධනයේ අහිමි වීම රජය මිල දී ගැනීමට සාපේක්ෂව අඩු වේ.යාම.
- රජයට පිරිවැයක් දැරීමට සිදු වීම.

## ❖ නිෂ්පාදනය මත සළාක නියම කිරීම. (කෝටා ක්‍රමය)

කිසියම් කාල පරිච්ඡේදයක් තුළ වෙළෙඳපලට සැපයිය හැකි නිමවුම් ප්‍රමාණය පිළිබඳ උපරිම සීමාවක් පැනවීම නිෂ්පාදන සළාක කිරීමයි. ආදායමේ අස්ථාවරයන්ට පිළියමක් ලෙස ද මෙය කරනු ලබයි. කෘෂිකාර්මික, කාර්මික භාණ්ඩ සම්බන්ධයෙන් මෙසේ නිමවුම් සළාක කරන අවස්ථා ඇත.




මෙහි දී කිසියම් නිශ්චිත නිමැවුම් ප්‍රමාණයක් පමණක් වෙළෙඳ පොළට සැපයීම සඳහා රජය විසින් තිරණය කොට තිබීමයි. මේ නිසා නිෂ්පාදකයාට හොඳ මිලක් ලැබේ. මෙවැනි සළාක කිරීම් කරනුයේ ද විශේෂයෙන්ම කෘෂිකාර්මික භාණ්ඩ සම්බන්ධයෙනි. එක් එක් නිෂ්පාදකයාට වෙන වෙනම මෙසේ නිෂ්පාදනය සීමා කිරීමට සිදු වේ.

කෙසේ නමුත්, එම භාණ්ඩ ප්‍රමාණය නිෂ්පාදනය කිරීමට ගිය වියදමට වඩා වැඩි ආදායමක් ලැබේ. එනම්, ආන්තික පිරිවැයට වඩා විශාල ආන්තික ප්‍රතිලාභයක් නිෂ්පාදකයාට හිමි වේ. මෙය ද රජයේ අකාර්යක්ෂම ආර්ථික ප්‍රතිපත්තියකි. නිෂ්පාදනය සීමා කරන බැවින් උපරිම නිෂ්පාදනය සිදු නොවේ.

නමුත් මෙය නිෂ්පාදකයාට වාසි සහගත බැවින් නිෂ්පාදකයෝ කැමති වෙති.නැතිනම් ඔවුන්ම මෙවැනි දේ කරනු ලබන අවස්ථා ඇත.

මෙවැනි සළාක කිරීම් ඇතිවන තවත් අවස්ථාවක් ලෙස ආනයන සළාක කිරීම දැක්විය හැකිය. දේශිය වෙළෙඳ පොළට ගලා එන ආනයන සීමා කිරීම් තුලින් දේශිය නිෂ්පාදකයා ධෛර්යමත් කරනු ලබයි. මෙම ප්‍රතිපත්තිය බොහෝ රටවල් කරනු ලබයි.

### මිල ස්ථායිකරණය සඳහා ආන්ඩුව මැදිහත්වීම.

භාන්ඩ වල මිල ස්ථායිකරණය සඳහා ගොවීන්ගේ ආදායම ස්ථාවරත්වයකට පත් කිරිම සඳහා සුලභ වශයෙන් යොදා ගැනෙන ක්‍රියා මාර්ග කිපයක් පහත දැක්වේ.

1. සහතික මිල ක්‍රමයක් හඳුන්වා දීම.
2. ඌණ පූරණ ගෙවීම් ක්‍රමයක් ක්‍රියාත්මක කිරිම.
3. නිෂ්පාදන සළාක හෙවත් කෝටා ලබා දී සැපයුම සීමා කිරිම.
4. භූමිය වගාව සඳහා යෙදො නොගැනිම දිරිමත් කිරිම පිණිස ගෙවීමක් කිරිම.
5. ස්වාරක්ෂක තොග රැස් කිරිම හා මුදා හැරිම.
6. අපනයන සහනාධාර ලබා දීම.
7. වෙළෙඳ පොළ තත්ත්වය පිළිබඳ නිවැරදි තොරතුරු කල් තියා සැපයීම
8. යෙදවුම් සහනාධාර ලබා දීම.
9. මෙහෙයුම් අලාභ ආවරණය කිරිම පිණිස ආධාර සැපයීම.

### නිෂ්පාදක ආධාරක වැඩ සටහන් ඇගයීම:-

- සහනාධාර නිසා වෙළෙඳ පොල යන්ත්‍රනයේ ක්‍රියාකාරිත්වය විකෘති වේ. අදි සැපයුමක් බිහි කරයි.
- සහනාධාර වල ප්‍රතිලාභ සාධාරණ ලෙස බෙදී යන්නේ යැයි කිව නොහැක. මහා පරිමාණ නිෂ්පාදකයෝ වැඩි ප්‍රතිලාබ භුක්ති විඳිති.
- යෙදවුම් සඳහා සහනාධාර දීම නිසා අනපේක්ෂිත අහිතකර බලපෑම් ඇති විය හැකිය. අහිතකර පාරිසරික බලපෑම් , භූමිය අධි උපයෝජනය,වීම.
- ආධාරක වැඩ සටහන් සඳහා වැයවන පිරිවැය, බදු අයකර ගැනීමෙන් පියවා ගැනේ. බදු බර නිසා වෙනත් කර්මාන්ත පීඩාවට පත්විය හැකිය.
- ආධාර මත රඳා පැවැත්ම නිසා පරාධීනතා මානසිකත්වයක් ගොඩ නැගේ.අකාර්යක්සම කර්මාන්ත දිගටම පවතිනු ඇත.

### මූලික ද්‍රව්‍ය ස්ථායීකරණය සඳහා ස්වාරක්ෂක තොග පවත්වා ගැනීම.

වාසි:-

- මිල ස්ථාවර වීම නිසා ගොවීන්ගේ ආදායම ස්තාවර වීම.
- වෙළෙඳ පොළ ස්ථාවරත්වය ඇති විට ප්‍රාග්ධන ආයෝජන ධෛර්යමත් වේ.
- යැපුම් කෘෂිකර්මාන්තය ශක්තිමත් වීම නිසා ග්‍රාමීය සමාජය ශක්තිමත් වේ.
- මිල ස්ථාවරත්වය පාරිභෝගිකයාට ද හිතකර වේ.

අවාසි:-

- අධි සැපයුම මිල දී ගැනීමට විශාල පිරිවැයක් දැරීමට සිදු වේ.
- සහතික මිල නිසා අධි නිෂ්පාදනයක් බිහිවීමේ නැඹුරුවක් පවතී.
- ආරම්භක ප්‍රාග්ධනය විශාල ප්‍රමාණයක් අවශ්‍ය කෙරේ.
- විශාල පරිපාලන වියදමක් සහ ගබඩා ගාස්තු පිරිවැය අධික වේ.
- සාර්ථකත්වය කෙරෙහි බලපාන වැදගත් කරුණක් වන්නේ, දිගුකාලීනව වෙළෙඳ පොළ සාමාන්‍ය මිල නිවැරදිව ඇස්තමේන්තු කිරීමේ හැකියාවයි.
- සහතික මිල - සාමාන්‍ය මිලට වඩා ඉතා ඉහළ අගයක් ගනු ලැබුවහොත් දිගින් දිගටම මිල දී ගැනීමේ යෙදීමට සිදු වේ. ඒ සඳහා පවත්නා තොග අලෙවි කිරීමට සිදු වුවහොත් මිල විශාල වශයෙන් පහත වැටේ.

❁❁❁

T.T.K
(දකුණු පළාත)